# බළන්ගොඩ නගර සභාව

## 2026.01.26 දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** **- බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය** **- 2026.01.26**

**වේලාව** **-පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති(වැ.බ) පේෂල නිකලන්ද මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති (වැ.බ) | පේෂල නිකලන්ද මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රුමී මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී පේමදාස මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රීනි | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රීනි | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ.එස් චන්දන මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී. ජයනක මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්.එච්.ඒ කරුණාරත්න මිය |

මෙදින විශේෂ මහ සභාවේ වැඩ කටයුතු පෙ.ව. 10.00 ට ආරම්භ කළ ගරු සභාපතිතුමන් විශේෂ මහ සභාව සඳහා සහභාගී වූ ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා සහ සභාවේ කාර්ය මණ්ඩලය පිළිගැනීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

01.පළාත් පාලන මාර්ග සංවර්ධනය -2025 වැඩසටහන යටතේ ප්‍රතිපාදන වෙන් වී ඇති බළන්ගොඩ අක්කර 18 මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ තාක්ෂණික ඇගයීම් වාර්තාව සඳහා අනුමැතිය ලබා ගැනීම.

**ලංසු පිළිබඳ නිරීක්ෂණය-** මෙම කර්මාන්තය සඳහා ලංසුපත් 04ක් පමණක් ඉදිරිපත් කර ඇත.පූර්ව සුදුසුකම් පරීක්ෂාව අනුව විස්තරාත්මක ලංසු ඇගයීම සඳහා සුදුසුකම් ලැබූ ලංසුකරුවන්ගේ ලංසුපත්හි ගණිතමය නිරවද්‍යතාවය අනුව අවම ලංසුකරු වනුයේ ඕකේ කන්ස්ට්‍රක්ෂන්, නො.07/6A, කරව්කැටිය පාර, බළන්ගොඩ යන ආයතනයයි.එම ආයතනය ලංසු කොන්දේසි ප්‍රකාරව ඉල්ලා ඇති සියළු සුදුසුකම් සපුරා ඇත.එබැවින් මෙම කර්මාන්තය සඳහා සාර්ථක ලංසුකරු ලෙස ඕකේ කන්ස්ට්‍රක්ෂන්,නො.07/06A, කරව්කැටිය පාර, බළන්ගොඩ ආයතනය සුදුසුකම් ලබයි.

**නිර්දේශය-**ඉහත නිරීක්ෂණයේ කරුණු සැලකිල්ලට ගත්කළ මෙම කර්මාන්තය සඳහා සාර්ථක ලංසුකරු වනුයේ ඕකේ කන්ස්ට්‍රක්ෂන්,නො.07/06A, කරව්කැටිය පාර, බළන්ගොඩ ආයතනය වන අතර එහි පිළිගත් ලංසු වටිනාකම රු.7,081,743.00 ක්වේ.එබැවින් මෙම කර්මාන්තය එහි පිළිගත් ලංසු වටිනාකම වන රු.7,081,743.00 ක මුදලට ඕකේ කන්ස්ට්‍රක්ෂන්,නො.07/06A, කරව්කැටිය පාර, බළන්ගොඩ යන ආයතනයට පිරිනැමීමට නිර්දේශ කර සිටිමු.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

02.බළන්ගොඩ නගර සභාවට අයත් මහජන පොළ පොදු වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කටයුතු 2025.12.22 දිනෙන් අවසන් වී ඇත.ඒ අනුව එම වැසිකිළි පද්ධතිය නඩත්තු කිරීම හා පිරිසිදු කර පවත්වා ගෙන යාම සඳහා නැවත ටෙන්ඩර් කිරීම හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම පිළිබඳ තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා පැවසූයේ පළමුව සභාවෙන් ක්‍රියාත්මක කර මාසික ආදායම් තත්වය පිළිබඳ තක්සේරු කර ටෙන්ඩර් කිරීම සුදුසු බවයි.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සඳහන් කලේ මහජන පොළ වැසිකිළි පද්ධතිය ටෙන්ඩර් කිරීම සුදුසු බවත්, ඉරිදා සතිපොළ දිනට රු.5000ක පමණ මුදලක් ලැබුනද සතියේ

අනෙකුත් දිනවල ලැබෙන ආදායම ඉතා අඩු බවත්, සභාවෙන් ක්‍රියාත්මක කිරීමේදී සේවකයන් යෙදවීම පිළිබඳ ගැටළුවක් පවතින බවත්, නමුත් පවතින අඩු ආදායම හේතුවෙන් ටෙන්ඩර් ඉදිරිපත් වීම පිළිබඳවත් සලකා බැලිය යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා පැවසුයේ සභාවෙන් සිදුකිරීමට වඩා ටෙන්ඩර් කිරීම සුදුසු බවත්, සභාවෙන් පවත්වා ගෙනයනවාට වඩා ටෙන්ඩර් කිරීමේදී පැමිණෙන චෝදනා වුවද ටෙන්ඩර්කරුට දන්වා නිවරදි කිරීම කළහැකි බවත්ය.ගරු සභාපතිතුමා පැවසුයේ මීට පෙර බස් නැවතුම්පොළ සහ සතිපොළ යන පොදු වැසිකිළි 02ම පිරිසිදු කර පවත්වා ගෙන යාම ටෙන්ඩර් ලබාදී තිබූ බවත්, නමුත් දැනට බස් නැවතුම්පොළ පොදු වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කරමින් සිටින බැවින් ටෙන්ඩර් ලබාදිය හැක්කේ මහජන පොළ පොදු වැසිකිළි පද්ධතිය පමණක් බවත්, එහි සාමාන්‍ය පොළ දිනක ආදායම රු.5000ක් බවත්, අනෙකුත් සතියේ දිනක සාමාන්‍ය ආදායම රු.800-1000ක් පමණ වන බවත්, එබැවින් සභාවේ සේවකයෙක් වැටුප් ගෙවා යෙදවීමේ ආර්ථික අවාසියකුත් පවතින බවත්, සභාවෙන් සිදු කිරීමේදි නඩත්තුව පිළිබඳ නිරන්තර සැලකිල්ල යොමු කළ යුතු බවත්,ටෙන්ඩර් කිරීමේදී ආදායම් උත්පාදනය සිදු කළ යුතු බැවින් ටෙන්ඩර්කරු එම වගකීම ගෙන සිදු කරනු ඇති බවත්,විශාල ජල බිල්පතක්ද ලැබෙන බවත්, මෙම කරුණු සැලකීමේදි තමාගේ පෞද්ගලික හැඟීම වන්නේද දෙපාර්ශවයටම සාධාරණයක් වන පරිදි ටෙන්ඩර් ලබාදීම සුදුසු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැවසුයේ සභාවෙන් පවත්වාගෙන ගිය මෙම කෙටි කාලසීමාව තුළද එම පොදු වැසිකිළිවල යම් කෑලි කඩාගෙන ගොස් ඇති බවත්, එබැවින් පවත්වා ගෙන යාම පිළිබඳ වගකිම ටෙන්ඩර්කරුට පැවරීමට තමන් යෝජනා කරන බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ මහජන පොළ පොදු වැසිකිළිය සභාවෙන් පවත්වා ගෙන ගිය කාලයට අදාළව සාමාන්‍ය මාසික ආදායම රු.40,000ක් පමණ වන බවත්, ඒ අනුව අවම මාසික ටෙන්ඩර් මුදල තීරණය කළ යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය මෙහිදී පැවසුයේ පසුගිය කාලයේ මෙම වැසිකිළි පද්ධතිය වෙත ජනතාව වැඩි වශයෙන් නොයෑමට හේතු වූයේ අපිරිසිදුකම ආදිය බවත්, නමුත් දැන් අළුත්වැඩියා කර ඇති බැවින් ජනතාව එය වැඩි වශයෙන් භාවිතා කරනු ඇති බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා ඉහත පොදු වැසිකිළිය ටෙන්ඩර් කිරීමේ අවම මාසික ලංසු මුදල රු.15,000 ක් විය යුතු බවට යෝජනා කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා ඉහත පොදු වැසිකිළිය ටෙන්ඩර් කිරීමේ අවම ලංසු මුදල රු.25,000ක් ලෙස යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදි.

**ඒ අනුව මහජන පොළ වැසිකිළි පද්ධතිය රු.25,000ක අවම ලංසු මුදල යටතේ ටෙන්ඩර්කිරීමට ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

03. බලංගොඩ නගර සභාව සතු නව බස්නැවතුම්පොල කඩ කාමර සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ අංක RT/RP/1323 හා 2023.01.23 දිනැති තක්සේරු වාර්තාව අනුව 2023.03.01 දින සිට එම තක්සේරුවට යටත්ව කඩ කුලීය අය කරන ලදී. (කී මනි කඩ කාමර 93, ටෙන්ඩර් ක්‍රමයට ලබා දී ඇති කඩ කාමර 50)

තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු වාර්තා නිකුත් කරනුයේ ඉදිරි වසර තුනක කාලයක් සඳහා වන අතර 2026 වර්ෂය වෙනුවෙන් නව තක්සේරුවක් ක්‍රියාත්මක කිරීමට ඇති අවශ්‍යතාවය මත තක්සේරු දෙපාර්තමේන්තුව වෙත කරන ලද ඉල්ලීමට අනුව RT/RP/1323 හා 2025.12.30 දිනැතිව ලබා දෙන ලද තක්සේරු වාර්තාව, 2025.12.30 දිනැති මහා සභාව වෙත යොමු කල අතර, 2026 ජනවාරි මස සිට නව තක්සේරුව මත ගිවිසුම්ගත වන ලෙසටත් නව තක්සේරුව අනුව කුලී මුදල් අය කරන ලෙසටත් සභාව විසින් අනුමත කරන ලදී.

නව තක්සේරුව මත කඩ කුලිය ගෙවීම අපහසු බවත්, තක්සේරුව ක්‍රියාත්මක කිරීම ඉදිරි වර්ෂ තුනකින් සිදු කරන ලෙසත්, තක්සේරු වටිනාකම අඩුකර කුලී මුදල් සංශෝධනය කර දෙන ලෙසත්, බලංගොඩ මධ්‍යම බස් නැවතුම්පොල වෙළඳ සංගමය විසින් ඉල්ලීමක් යොමුකර ඇති බැවින් ඒ පිළිබඳ ඉදිරි කටයුතු තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඉහත යෝජනාව පිළිබද අදහස් දැක්වූ ගරු සභාපතිතුමන් පැවසූයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ලබාදුන් නව තක්සේරුව ක්‍රියාත්මක කිරීමට පසුගිය සභා වාරයේදී තීරණය කළ බවත්, ඒ අනුව ජනවාරි මස සිට නව තක්සේරුව මත කඩ කුලී අයකිරීමට තීරණය කළ බවත්,නමුත් කඩ කුලී වැඩිවීම සම්බන්ධව සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබා නොදුන් බව බස් නැවතුම්පොළ කඩ හිමියන් පවසන බවත්, ඒ අනුව ඔවුන් මෙම ඉල්ලීම යොමු කළ බවත්, මේ සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ පළාත් සභාවේදී නව තක්සේරුව සම්බන්ධයෙන් සාකච්ඡාවක් මෙම මස 29 වැනිදා පැවැත්වෙන බවත්, ඒ අනුව එම සාකච්ඡාව සඳහා මෙම කඩ හිමියන් කිහිපදෙනෙකු සම්බන්ධ කිරීමට පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් ඉල්ලීම් කළ බවත් එයට අවස්ථාව ලැබුණු බවත්, ඉන් අනතුරුව එළඹෙන තීරණයක් මත ඉහත ඉල්ලීම සඳහා ඉදිරි කටයුතු තීරණය කළ හැකි බවත් ඒ අනුව ඉහත ඉල්ලීම පිළිබඳ අදහස් දක්වන ලෙසත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පැවසූයේ මෙම ඉල්ලීම් ලිපියේ පිටපතක් ලැබුණ බවත්, එම කඩ හිමියන්ගේ ඉල්ලීම සාධාරණ බවත්,සභාවෙන් තීරණයක් ගෙන ඒ සඳහා යම් සාධාරණයක් ඉටුකිරීමේ හැකියාවක් තිබේනම් ඒ පිළිබඳ සලකා බැලිය යුතු බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ ඒ පිළිබඳ වාචිකව විමසීමක් කළ බවත්, සභාව මඟින් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාදුන් නව තක්සේරුවක් ක්‍රියාත්මක නොකර සිටීමේ හැකියාවක් නොපවතින බවත්, තක්සේරු ගාස්තු ගෙවීමට සිදුවන බැවින් නැවත නව තක්සේරුවක් ලබාගැනීමේ හැකියාවක් නොපවතින බවත්, ආණ්ඩුකාරතුමිය හරහා අනුමැතියක් ලැබෙන්නේ නම් මිස නව තක්සේරුවේ සඳහන් කුලී ගාස්තු අඩු කිරීමේ හැකියාවක් නොපවතින බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා සඳහන් කලේ ගරු සභාපතිතුමා පැවසූ පරිදි රජයෙන් තක්සේරු කළ පසු නැවත තක්සේරු කිරීමේ හැකියාවක් නොපවතින බවත්, නමුත් සභා තීරණයක් ලබාගෙන ආණ්ඩුකාරතුමියගේ අනුමැතියක් ලබාගෙන එසේ කළහැකි බවත්, එම කඩ හිමියන්ට ලැබී ඇති හොඳම අවස්ථාවක් වන්නේ 29 වෙනිදා පැවැත්වෙන සාකච්ඡාව බවත්, එහිදී ඔවුන් නීත්‍යානුකූලව චක්‍රලේඛනයක් වසර තුනකට වරක් තක්සේරු කළ යුතු බව කඩ හිමියන් දැනුවත් වන බවත්, නොඑසේනම් සභාව මඟින් කඩ කුලී සංශෝධනය කරන ලෙස කඩ හිමියන් සිතන බවත්, නව තක්සේරුව වෙනස් කිරීම කළ හැක්කේ ආණ්ඩුකාරතුමියගේ අනුමැතියෙන් පැමිණෙන තීරණ මත බවත්ය.

අනතුරුව ගරු සභාපතිතුමා පැවසුයේ 29 වෙනිදා සාකච්ඡාවෙන් පසු පැමිණෙන තීරණ මත ඉදිරි කටයුතු තීරණය කිරීම සුදුසු බවයි.

04.බළන්ගොඩ නගර සභාව සතු තානායම සහා පරිපාලනය යටතේ ක්‍රියාත්මක කිරීමටත්,ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය පත් කිරීමටත්, කමිටු පත්කිරීමටත් සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමන් පැවසුයේ මේ සම්බන්ධයෙන් පසුගිය මුදල් කාරක සභාවේදී දීර්ඝව සාකච්ඡා කළ බවත්, පසුව එම කණ්ඩායම තානායම නිරීක්ෂණයටද සහභාගී වූ බවත්, එහිදී මෙවැනි සම්පතක් භාවිතා නොකර සිටීම අපරාදයක් ලෙස හැඟුන බවත්, ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමට කැබිනට් තීරණයක් ගෙන තිබුනද එම පවරාගැනීම සිදුවන තුරු තානායම නිෂ්කාර්යව පැවතීම අපරාදයක් බැවින් මුදල් කාරක සභාවේදිද තීරණය වූයේ තානායම සභාව මඟින් පවත්වා ගෙන යාමට බවත්, ඒ අනුව ඉහත යෝජනාව සභාව වෙත ඉදිරිපත් කළ බවත්, පොදුවේ ගත්කල සභාවෙන් තානායම පවත්වා ගෙන යාම වාසි සහගත බවත්, වැටුප් ප්‍රතිපූර්ණය කප්පාදු කිරීම වැනි කාරණා හමුවේ නව ආදායම් උත්පාදන මාර්ග වෙත යොමුවීමට ඇති අවස්ථාවක් බැවින් එය මඟහැරගතයුතු නොවන බවත්, එමෙන්ම ඉදිරියේදි බළන්ගොඩ නගරය සංචාරක පුරවරයක් ලෙස දියුණු කිරීමට ආසියානු සංවර්ධන බැංකු ආයතනයේ ව්‍යාපෘති යෝජනාවක් පවතින බවත්,ඒ සඳහාත් තානායම සභාව මඟින් පවත්වා ගෙන යාම වැදගත් වනු ඇති බවත්, සභාවේ පැවැත්වෙන උත්සව ආදිය පැවැත්වීමේදීත් වැදගත් වන බවත්ය.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසුයේ ඉහත වාසි සේම අනෙක් පසින් තානායම සභාව මඟින් පවත්වා ගෙන යාමේ අවදානමක්ද පවතින බවත්, නිසි කළමණාකරණයකින් තොර වුවහොත් මෙය සභාවට අමතර වියදමක් විය හැකි බවත්ය.එමෙන්ම විධිමත් පරිදි මාසික ආදායම් වියදම් වාර්තා පවත්වා ගෙන යමින් මාසිකව ආදායම් වියදම් විශ්ලේෂණයන් සභාව වෙත ඉදිරිපත් කරමින් විධිමත් අධීක්ෂණයකින් පවත්වා ගෙන ගියහොත් එය සාර්ථක අදායම් මාර්ගයක් වනු ඇති බවත්, එබැවින් ඒ පිළිබඳ අදහස් දැක්වීමට ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා වෙත ආරාධනා කරන බවයි.

ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා පැවසුයේ මීට පෙර සභාවකින් තානායම පවත්වා ගෙන ගොස් ඇති බවත්, ඒ පිළිබඳ විස්තර දැනගැනීම අවශ්‍ය බවත්ය.

ඉහත කරුණු සාකච්ඡා කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

තානායම ටෙන්ඩර් කැඳවනවාද සභාවෙන් පවත්වා ගෙන යනවාද යන්න පිළිබඳව කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සඳහන් කලේ මෙම කාර්යය ආරම්භ කිරීමට ගරු සභාපතිතුමා මූලිකත්වය ලබා ගන්නා ලෙසත්, එසේ නොමැතිනම් මෙය සෑම සභා වාරයකම සාකච්ඡා කිරීම පමණක් සිදුවන බවයි.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ තානායම් නිරීක්ෂණයට සහභාගි වී දැනට දින ගණනක් ගත වී ඇති නමුදු තවමත් එහි පිරිසිදු කිරීම් කටයුතු පවා සිදුකර නොමැති බවයි.ගරු සභාපතිතුමා පැවසුයේ සභාවේ අදදින තීරණයෙන් පසු එම සියළු කාර්යයන් කඩිනමින් සිදුකළ හැකි බවත්, තානායම් කටයුතු අධීක්ෂණය හා පරිපාලනය වෙනුවෙන් කමිටුවක් පත් කළ යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැවසුයේ මෙය කඩිනමින් ආරම්භ කිරීමට පියවර ගත යුතු බවත්, සභාපතිතුමා සමඟ මෙම කටයුතු අධීක්ෂණය වෙනුවෙන් නිලධාරියෙකු පත්කිරීම සුදුසු බවට හැඟෙන බවත්, ඒ අනුව ඒ පිළිබඳ සලකා බලන ලෙසත්ය.මෙහිදී ගරු සභාපතිතුමා සභාවෙන් තානායම පවත්වාගෙන යන්නේ නම් එයට පත්කළ යුතු නිලධාරී මණ්ඩලය සහ තනතුරු බාහිරින් බඳවා ගන්නේ නම් ඒ පිළිබඳවද තීරණය කළ යුතු බව පවසන ලදී.

ඒ අනුව සභාවේ තානායම සභාවෙන් පවත්වා ගෙන යාම වෙනුවෙන් පහත කාර්යයන් කඩිනමින් සිදු කිරීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර එකී යෝජනාව ගරු සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

- ප්‍රධාන කළමණාකරුවෙකු, සූපවේදියෙකු, සූපවේදී සහායකයෙකු, කාමර සහායකයන් දෙදෙනෙකු ලෙස අමතර කාර්යමණ්ඩලය බඳවා ගැනීම.

- ගබඩා භාරකරුවෙකු හා සුපරීක්ෂකවරයෙකු සඳහා වන නිලධාරීන් සභාවේ කාර්යය මණ්ඩලයෙන් ලබා ගැනීම.
- සභාවෙන් තානායම් කළමණාකරණ කමිටුවක් පත්කර එම කමිටුව හරහා සියළු මිලදිගැනීම් සිදුකිරීම හා ගබඩා පාලනය සතියකට වරක් සිදුවන ලෙස පවත්වා ගෙන යාම.

ඒ අනුව තානායම් කළමණාකරණ කමිටුව ලෙස සභාපති, ලේකම්, ගණකාධිකාරී සහ සභාවේ මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා පත් කරන ලෙසට ගරු සභාපතිතුමන් පවසන ලදී. එම කමිටුව වෙත ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරි මන්ත්‍රී ඩබ්.ඩී.වසන්ත කුමාර මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත කමිටුව වෙත ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා,එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා  යන මන්ත්‍රීතුමන්ලා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා.ඩී වීරසිංහ මැතිතුමිය විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ඉහත කමිටුව වෙත ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.විරසිංහ මැතිතුමිය විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව තානායම ඉහත කළමණාකරණ කමිටුව යටතේ සභාවෙන් පවත්වාගෙන යාමටත් ඒ සඳහා ප්‍රධාන කළමණාකරුවෙකු, සූපවේදියෙකු, සූපවේදී සහායකයෙකු, කාමර සහායකයන් දෙදෙනෙකු ලෙස අමතර කාර්යමණ්ඩලය කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමටත් ගරු සභාවේ විරෝධතා නොවූ හෙයින් ඒකමතිකව සම්මත විය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ මෙම දිනවල නගරයේ අනවසර ඉදිකිරීමක් සම්බන්ධව සමාජ මාධ්‍යය කැළඹෙන බවත්, ඒ පිළිබඳ සභාව දැනුවත් කිරීම සුදුසු බවයි.ගරු සභාපතිතුමා කරුණු සඳහන් කරමින් පවසා සිටියේ ඒ සම්බන්ධව දැනුවත් වූ බවත්, ඒ අනුව එම අනවසර ඉදිකිරීම් තාවකාලිකව අත්හිටුවා ඇති බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා පැවසූයේ වැඩ අධිකාරී මහතාගෙන් විමසීමේදී මෙම ඉදිකිරීම නීත්‍යානුකූල බවත්, නාගරික සංවර්ධන අධිකාරියෙන් සහ මාර්ග සංවර්ධන අධිකාරිය යන ආයතනවල අනුමැතිය සහිත බවත් පැවසූ බවයි.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැවසූයේ මේ පිළිබඳව කරුණු පැහැදිලි කිරීමක් සිදු කළ යුතු බවත්, එම ස්ථානයේ මාලිමාව පක්ෂ කාර්යාලය ඊට ආසන්න ගොඩනැගිල්ලක පැවති බැවින් මෙම ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති බවට විශාල ගැටළුවක් ඇති වි තිබූ බවත්, ඉහත ගැටළුවට  සම්බන්ධ  ඉදිකිරීම සඳහා සැලසුම අනුමත කරගෙන ඇත්තේ 2023.05.14 දින බවත්, එය සංශෝධන සහිතව නැවත වරක් 2025.04.29 දින

අනුමත කර ඇති බවත්, එම කාලය වන විට මෙම සභාව පත් වී තිබූ නොමැති බවත්, අනුමැතියක් සහිත සැලසුමක් බවත්, 2004 වර්ෂයේ භූ විද්‍යා ආයතනයේ අනුමැතිය ලබා ගෙන ඇති බවත්, මෙවැනි කාර්යයන් දේශපාලනය මඟින් අනුමැතිය ලබා දීමට තමන් ඇතුළු පක්ෂයට කිසිඳු අවශ්‍යතාවයක් නොවන බවත්, මාලිමා රජය පත් වී ඇත්තේ වංචාව දූෂණය පිටු දැකීමට බවත්, මේ සඳහා පූර්ව පරීක්ෂණයක් සිදු කරන ලෙසත් ඒ සම්බන්ධව කරුණු පසුව සභාවට ඉදිරිපත් කර සමාජගත කරන ලෙසත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ ලස්සනට තිබිය යුතු නගරයක් අවලස්සන වී ඇත්තේ අනවසර ඉදිකිරීම් හේතුවෙන් බවත්, නගරයේ අනවසර ඉදිකිරීම් බොහොමයක් පවතින බවත්, ඒවාට අවසර ලබා දී ඇත්තේ කෙසේද යන්න ගැටළුවක් බවත්ය.බළන්ගොඩ නගරයේ සෑම තැනකම අනවසර ඉදිකිරීම් පවත්නා බවත්, ඒ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ වගකීම පවතින්නේ සභාවට බවත්, පෞද්ගලික හිතවත්කම් මත නඩු දැමීම සිදු නොකරන බවත්, එම ස්ථානයේ පක්ෂ කාර්යාලයට දීලා තිබුනද එම ස්ථානයද අනවසර නම් ඒ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු බවත්, මේ සඳහා මාර්ග සීමාවන් නම් කරන්නේ නැතිව අවසර ලබා දුන්නේ කෙසේද යන්න පිළිබඳවත් සොයා බැලිය යුතු බවත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා කරුණු දක්වමින් පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ අනුමැතිය සහිත ඒවා නොව අනුමැතිය රහිත අනවසර ඉදිකිරීම් පවතින බවත්, ඉදිරියේදී ඒවා සම්බන්ධව ක්‍රියාමාර්ග ගන්නා බවත්, ඉහත ඔරලෝසු කණුව අසළ ගැටළුව සම්බන්ධව වැඩ අධිකාරි මහතා මඟින් වැඩිදුර කරුණු විමසීම් කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අනතුරුව කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**11. අවසානය**

අනතුරුව ගරු සභාපතිතුමා අද දින ගරු සභාව වෙත සහභාගී වී අද‍දින විශේෂ මහ සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සඳහා වෙතද ස්තුතිය පුදකරමින් පෙ.ව.11.22 ට පමණ මෙදින විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

**එන්.ඩබ්.පී.ටී ජයසේන ,**

සභාපති (වැ.බ),

බළන්ගොඩ නගර සභාව.